මදුසංඛ දැකුම්පිය



යුතුකම් දන්නා නොමියන මිනිසුන් මැද මිනිසා. වසර 13ක් ගෙවුන තැන අදටත් අද ඊයේ වගේ මට හැගෙන්නෙ. හේතුව මට ඇත්තටම දැනුනේ නෑ එපමන කලක් ගෙවුනා කියා. මටනම් අවංකව අද ඊයෙ වගේ.

ගාමිනි ෆොන්සේකා, මේ කියන්නෙ ඔහු ගැන. ඔහු අපෙන් සමු අරගෙන ගියේ කයෙන් පමනි. අපේ සිතින් කවදාවත් ඒ මහා මිනිසා, නළුවා සමුගන්නෙ නෑ. ඔහු තරම් මේ සිනමාව තුළද මේ රට තුළද ජනප්‍රිය පුදගලයෙක් නෑ. ඒක අපි හිස නමා පිලිගන්න වෙනව. ඔහුට සම කරන්න පුලුවන්නම් පුලුවන් දෙන්නයි.ඒ විජය සහ ජෝති සර් පමණයි.

ඒත් ඊටත් වඩා මහ පවුරක් වැනි මේ මිනිසා මගේ පරිචයට පුරවා ඉවරකරගන්න බැරිතරම්.

දිනේශ් ප්‍රියසාද් දිනක් ඔහු ගැන ලස්සන නිර්වචනයක් දෙනව. ගාමිනී කියන්නෙ කන්-දක් මම කෙන්දක් කියල. ඔව් අපි කෙන්දක් ඒ කන්ද ගැන කතාකරන්න.

සිනමාව තුළ ඔහුට නොලැබුන දෙයක් නෑ .මේ රට තුල ජනපතිකම හැරෙන්න ඔහුට අඩුපාඩුවක් නෑ. ඔහු ඇත්තටම චන්ඩියෙක් ,ඔහු කාටත් බය නෑ, ඔහු ප්‍රේමවන්තයෙක් ,ගැහැනුන් ඔහුට අඩු නෑ

ඔහු කාටවත් නය නෑ (ඔහුගේ නිවාසවල අදටත් සමහර කලාකරුවන් ජීවත්වෙනව) ඔව් ඔහුව පරාදකරන්න සැබෑ ජීවිතය තුලදී මිනිසෙක්වත් ,නළුවෙකවත් නෑ. ඔහු රඟපාන්නත් දන්නව ඔහු අධ්‍යක්ශණයත් දන්නව ඔහු කැමරාවත් දන්නව ඔහු ආලෝකකරනයත් දන්නව, ඔහු ගහගන්නත් දන්නව ඔහු අඬන්නත් දන්නව, ඔහු මල්ගස් වටේ දුවන්නත් දනව, ඔහු නටන්නත් දන්නව, ඔහු මොනාද නොදන්නෙ ඒකයි ඔහු සක්විතිවෙන්නෙ.

එක්ච්වර පරිපූර්න නළුවෙක් මිනිසෙක් මේ සිනමාවෙ හෙටත් නැතිවෙයි. ඔහු ගිතත් ලියනව, ඔහු ගීත විචාරයත් කරනව, ඔහු හොරෙන් ගයනව, ඔහු වාදනයත් කරනව, ඔහු මිනිසුන් අගයකරනව, ඔහු මිනිසුන්ට සලකනව ඉතින් ඔහු සකල කලා පිරි ගුන ගරුක මිනිසෙක් නේද.

විජය නම් අසහය නළුවා පවා රැකගත්තේ



# නොමියෙන මිනිසා

## රසිකයකුගේ සටහනක්

අපේ සිනමාව තුල ජාතික වීරයා වන ඔහු ඉපදෙනකොට අපි නොසිටියාට, ලොකු හිස්කමක් ඉතුරුකර මිය ගිය දිනය තාමත් රූපවාහිනී තිරයේ දුටු හැටි සිහිවෙනව. ලෙස්ටර් නම් මහා සිනමා අධ්‍යක්ශකවරයා ගාමිණී ෆොන්සේකයන් තුළින් නිධානයක් උදාකලා වගෙයි.

ලෙස්ටර් කොතරම් පිරිසිඳුද කියනවනම් දෙයක් ඇල්ලු සැනින් අත සෝදන



පුද්ගලයෙකි. නමුත් ඔහු කිසි කිලුටක් නැතිව ගාමිනි සර්ගෙ නිසල දෙහය ලඟටවිත් හිස අතගානවා. හරියට පියෙක් තම පුතාගෙ මළගම දුටුවා වගේ තියෙන්නෙ ඇති ලෙස්ටර් සර්ගෙ හිතට. ඔහුට ඔහුගේ සිරිත් පවා අමතක කරවන්න තරම් මේ මිනිසාගෙ අභාවය දරුණු වේදනාවක් කළා.

2004 මට තනියම යන්න එන්න පුලුවන් උනානම් මමත් ගාමිනි සිර්ගෙ මළගමේ පෝලිමේ ඉන්න තිබුනා.

නැති තරු ගුණය, ඔහු තම ජීවිතය මෙන් රැක ගත්තේ සිනමාවට ඇති ආදරය නිසයි. සිනමාවට ඇති යුතුකම් ඉටු කිරීමටයි. වෘත්තීය ගෞරවය එතරම් දුරට රැක්ක නළුවෙක් අදනම් නෑ.

ලෙනින් මොරායස්ගෙ ෆිල්ම්ස්වලට බරක් දුන්නෙ නීල්ගෙ ෆිල්ම් වලට පිටකොන්දක් උනේ ලෙස්ටර්ගෙ ෆිල්ම් වලට වටිනාකම්ක් දුන්නෙ සේන සමරසිංයට හෙට දවසක් හැදුවෙ සුනිල් ආරියරතනට වැලේ වැල් නැති නොකළේ මෙකී නොකී අධ්‍යක්ෂක්වරුන්ට ගොඩයන්න පුලුවන් කළේ ගාමිනි සර්.

ලංකාවෙ හොඳම චිත්‍රපටි 10ට ඇතුලත් තම කුලුදුල් සිනමාපටය අවුරුදු 29ක වගේ තරුණයෙක්ට අද්ධ්‍යක්ශණය කරන ගමන් රඟපාමින් අදත් කිරීම අපහසු වැඩක්. ඉතින් එදා දල සේයාපට අස්සෙ ඔට්ටුවෙමින් ඔහු මේක කොහොම කරන්න ඇතිද.

පරසතු මල අපසතු කල ඔබ ලොව පළමු නිර්මානකරුවා වෙන්න ඇති එතරම් සාර්ථක උන.

මා මෙය පටන් ගත්තේ යුතුකම් දන්නා නොමියන මිනිසුන් මැද මිනිසා කියලයි. දැන් කියන්නම් මා හේතුව. පිරිමියෙක් උනාම කසාද බඳින්න ඕනෙලු පුතෙක් හදන්න ඕනෙලු. ඔව් ඔබ ඒ දෙකම කළා. ඔබ පුතෙක් හැදුව. ඒක අඩම්මබරයක්.

නමුත් ඔබ මේ සිනමාවෙන් අයින් වෙද්දි හොඳ නලුවෙක් හැටියට දමිත්ව මේ සිනමාවට දෙන්න බැරි උනා. ඔහුට කවදාවත් මේ සිනමාව ඔබ මෙන් හොල්ලන්න බැරි උනා. අඩුම තරමෙ එවකට හිටි එක නළුවෙකවත් පරයා යන නළුවෙක් ඔබෙ පුතාගෙන් ඔබට දෙන්න බැරි උනා. ඒත් කොහෙවත් යන කරුමෙකට එක බාරදීල ඔබට අත පිහිදගන්න තිබුන.

නෑ ඔබ එහෙම කලේ නෑ. ඔබ දැනන් හිටිය ඔබේ වගකීම සහ යුතුකම. ඔබ යුතුකම් පැහැර හැරියෙ නෑ.ඔබ රත්තරං කුට්ටි දෙකක් වගේ නළුවන් දෙදෙනෙක් අපේ සිනමාවට බාරකර යුතුකම් ඉටු කොට සිනමවෙ අන්තිම රැයෙන් නතර උනා.
ගෙදර පුතා ඉද්දි සාගරයක් මැදට නලුඑක් හෙව්වේ මේ අමන රටින් .ගෙදර සම්මුඛ පරීක්ශණය තබද්දි තම පුතා සමගින් හරි හරියට කතාවට වැටී තරුණයාව සිනමාවට ගේන්නෙ ඔබ අපිට තවත් සිහින කුමරයෙක් පූජාකරමිනි. ඔව් ඒ කමල් අද්දරාආරච්චි.

ඉන්පසු ඔබ අපිට ඔබ මෙන් තවත් සක්විතියෙක් පූජකලේ සක්විති සුවයෙන් . ඒ මහෙන්ද්‍ර පෙරේරායි. ගාමිනි සර්ගෙ කාර් එකට එබී ගාමිනි සර්ව බලද්දි කවදාවත් හිතන්නෙ නැතිව ඇති මහෙන්ද්‍රයන් මේ පුද්ගලයා ස්මග රඟපාන්න ලැබෙයි කියා. ඉතින් මේ රත්තෘඅං කුට්ටි දෙක අපෙ සිනමාවට ඔබ පූජා කර ගියේ යුතුකම් දන්න නලුවෙක් හැටියට නෙවෙයි මිනිසෙක් හැටියට.

.

ඔබ ඉතින් කොහොමද අපෙන් සමුගත්තාවන්නෙ. ඔබ කීව වගෙම ඔබ නොමියන මිනිසෙක්.

කලකරුවා ජීවත්ව සියදී ජීවත්වෙයි. කලාකරුවා මිය ගිය පසු අමරනීය වෙයි. ගාමිනී සර් එයට හොඳම උදාහරනය වන්නේ

රසිකත්වයෙන් ඔබ ලග ඉම් සදා

Dias Maths
M. Sc Mathematics (USA)
M. Sc Computer Science
B. Sc Mathematics
Mathematics
Grades 6 / 7 / 8 / 9 / 10
VCE – General Maths /
Maths Methods / Specialist Maths
0431 182 632
keerthicnc@yahoo.com
Home visiting
www.facebook.com/DiasMaths